දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල ) postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி )
e-mail )

වෙබ් අඩවිය ) www.health.gov.lk
இணையத்தளம் )
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

මගේ අංකය ) MH/AE/07/PHM/03/2020
எனது இல )
My No. )

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )2024.01.03
திகதி )
Date )

පොදු චක්‍රලේඛ අංක - 02-185/2023

ශ්‍රී ලංකා ජාතික රෝහලේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
මහනුවර ජාතික රෝහලේ අධ්‍යක්ෂ,
සියලුම ශික්ෂණ රෝහල් සහ මහ රෝහල් අධ්‍යක්ෂවරුන්,
සියලුම මූලික රෝහල්වල වෛද්‍ය අධිකාරිවරුන්,
ඇතුළු සියලුම සෞඛ්‍ය ආයතන ප්‍රධානීන් වෙත,

<u>අතුරු වෛද්‍ය සේවාවේ ශ්‍රේණිගත උසස්වීම් සලකා බලනු ලබන කාල සීමාවන් සංශෝධනය කිරීම</u>

**01.** අතුරු වෛද්‍ය සේවා ගණයට අයත් තනතුරුවලට අදාල රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත බඳවා ගැනීමේ පරිපාටි සහ සෞඛ්‍ය ලේකම්ගේ අංක MH/AE05/01/2019 හා 2022.08.31 දිනැති පොදු චක්‍රලේඛ ලිපි අංක 02-81/2022 අනුව අතුරු වෛද්‍ය සේවාවේ ශ්‍රේණිගත උසස්වීම් සලකා බලනු ලබන කාල සීමාවන් පහත පරිදි සංශෝධනය කිරීමට රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/EST/7/1/13/1/2012(Vol II) හා 2023.10.11 දිනැති ලිපියෙන් අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව ඉදිරි ශ්‍රේණි උසස්වීම් සිදු කිරීමේදී පහත විධිවිධාන අදාල වේ.

**01.1 බඳවා ගැනීමේ පරිපාටියේ 10.2.1.2 වගන්තිය අනුව II ශ්‍රේණියේ සිට I ශ්‍රේණියට උසස් කිරීම**

01.1.1. 2021.07.05 දින හෝ ඊට පෙර පැරණි බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් සම්පූර්ණ කර ඇති, එහෙත් එදිනට පෙර II ශ්‍රේණියට උසස් වී නොමැති නිලධාරීන් සඳහා පහත විධිවිධාන අදාල වේ.

01.1.2. පැරණි බඳවා ගැනීමේ පටිපාටියේ සඳහන් විධිවිධාන අනුව II ශ්‍රේණියට උසස් වීමට සුදුසුකම් සම්පූර්ණ කර ඇති දිනයේ සිට 2021.07.05 දිනය දක්වා වන සක්‍රිය හා සතුටුදායක සේවා කාලය I ශ්‍රේණියට උසස් කිරීමේ දී II ශ්‍රේණියේ සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් ලෙස සලකනු ලැබේ.

**01.2 බඳවා ගැනීමේ පරිපාටියේ 10.3.1.2 වගන්තිය අනුව I ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට උසස් කිරීම**

01.2.1. 2021.07.05 දිනට පෙර **I** ශ්‍රේණියට උසස් වී වසර 22 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් **I** ශ්‍රේණියේ වසර 07 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට බඳවා ගැනීමේ පරිපාටියේ පහත සඳහන් සුදුසුකම් සලකා අධි ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

- **i.** අනුමත කාර්ය සාධන ඇගයීමේ පරිපාටිය අනුව උසස්වීම් දිනට සලකා බලන කාලය තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.
- **ii.** රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූල දඬුවමක් ලබා නොතිබීම
- **iii.** I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය නියමිත දිනට සමත් වී තිබීම

01.2.2. 2021.07.05 දිනට පෙර **II** ශ්‍රේණියේ වසර 07 ක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් අධි ශ්‍රේණියට උසස් කිරීමේ දී **I** ශ්‍රේණියේ වසර 07 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සහිතව අතුරු වෛද්‍ය සේවයේ වසර 22 ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනයේ සිට උක්ත 1.2.1 යටතේ සඳහන් සුදුසුකම් සලකා උසස් කරනු ලැබේ.

01.2.3. 2021.07.05 දින හෝ ඊට පෙර අධි ශ්‍රේණියට උසස් වී ඇති නිලධාරීන්ගේ ඒකාබද්ධ සේවා කාලය වසර 22 ඉක්මවන අවස්ථාවක දී උපරිම වසර 03 කට යටත්ව I ශ්‍රේණියේ වසර 07 කට වඩා වැඩි සක්‍රිය හා සතුටුදායක සේවා කාලය එම නිලධාරීන්ගේ අධි ශ්‍රේණියේ සේවා කාලයක් ලෙස සලකනු ලැබේ. කෙලෙස වුව ද මෙම විධිවිධානයන් අනුව අධි ශ්‍රේණියට උසස්වීම් ලබා දී ඇති දිනයේ වෙනසක් සිදු කරනු නොලැබේ.

02. ඒ අනුව **II** ශ්‍රේණියේ සිට **I** ශ්‍රේණියට හා **I** ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට උසස් කිරීමට අදාළව මෙහි දක්වා ඇති විධිවිධාන අනුව සුදුසුකම් ලත් නිලධාරීන්ගේ අයදුම්පත් ඇමුණුම 1 ප්‍රකාරව සකස් කර ආයතන ප්‍රධානියාගේ නිර්දේශ සහිතව යොමු කිරීමට කටයුතු කරන ලෙස මෙයින් කාරුණිකව දන්වමි.

03. එසේම මෙම ලිපියෙන් ආවරණය නොවන කරුණක් සම්බන්ධයෙන් අවසන් තීරණය සෞඛ්‍ය විෂයභාර අමාත්‍යාංශයේ ලේකම් සතු වන අතර, මෙම නිවේදනයේ සිංහල, දෙමළ හා ඉංග්‍රීසි පාඨ අතර යම් පරස්පරතාවයක් ඇති වුවහොත් එවැනි අවස්ථාවක දී සිංහල භාෂා පාඨය බලපැවැත්වෙන්නේය.

වෛද්‍ය පී. ජී. මහීපාල
ලේකම්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

වෛද්‍ය පී.ජී.මහීපාල,
ලේකම්.

පිටපත් -

- **i.** සියලුම පළාත් රාජ්‍යසේවා කොමිෂන් සභා ලේකම්වරුන් -කරු.දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
- **ii.** සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරුන් - කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
- **iii.** සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් - කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා
- **iv.** සියලුම ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන් - කරු. දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා

ඇමුණුම 01

**අතුරු වෛද්‍ය සේවාවේ වසර 22 ක සේවා කාලය සම්පූර්ණ වීම මත I ශ්‍රේණියේ සිට අධි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන අයදුම්පත්‍රය**
**(2021.07.05 දින සිට අදාල වේ)**

**01 කොටස :- (අදාළ නිලධාරිනිය / නිලධාරියා විසින්ම සම්පූර්ණ කළ යුතුය)**

I. (අ) නිලධාරියා/නිලධාරිනිය ගේ මුලකුරු සමඟ නම :-
............................................................

(ආ) සම්පූර්ණ නම :-
............................................................
............................................................
............................................................

(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය :- ..............................

(ඈ) උපන් දිනය :- ..............................

(ඉ) කාර්යාලීය ලිපිනය :- ..............................

(ඊ) ජංගම දුරකථන අංකය :- ..............................

II. වර්තමාන සේවා ස්ථානය :- ..............................

III. මුල් පත්වීම් ලද දිනය :- ..............................

IV. පත්වීම ස්ථිර කර ඇති දිනය:- ..............................

V. II ශ්‍රේණියට උසස් වූ දිනය හා ලිපි අංකය :- ..............................

VI. (අ) I ශ්‍රේණියට උසස් වූ දිනය හා ලිපි අංකය :- ..............................

(ආ) I ශ්‍රේණියේ අවම වශයෙන් වසර හතක (07) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද දිනය :- ..............................

(ඇ) මුල් පත්වීමේ සිට වසර විසි දෙකක (22) ඒකාබද්ධ සක්‍රීය හා සතුටුදායක සේවා කාලය සම්පූර්ණ කරනු ලබන දිනය :- ..............................

(ඈ) පළමු ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන තෙවැනි කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වූ දින/දිනයන් (සහතික කරන ලද ප්‍රතිඵල ලේඛනයේ පිටපතක් අමුණන්න) :-
............................................................

ඉහත අංක I සිට VI දක්වා තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බවට සහතික කරමි.

............................................ ............................................
දිනය නිලධාරියා/නිලධාරිනියගේ අත්සන

**02 කොටස :- (විෂය භාර නිලධාරියා/නිලධාරිනිය විසින් අදාළ නිලධාරියාගේ/නිලධාරිනියගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව සම්පූර්ණ කළ යුතුය)**

I. (අ) I ශ්‍රේණියේ වසර හතක (07) සක්‍රීය හා සතුටුදායක සේවා කාලය තුළ වැටුප් රහිත නිවාඩු (ප්‍රසූත නිවාඩු හැර) ලබා ඇති/නැති බව :-

.................................................................................................................................................................

(ආ) වැටුප් රහිත නිවාඩු (ප්‍රසූත නිවාඩු හැර) ලබා ඇත්නම් ඊට අදාළ කාල සීමාව සහ හේතුව :-

.................................................................................................................................................................

.................................................................................................................................................................

II. (අ) අතුරු වෛද්‍ය සේවයේ අධි ශ්‍රේණියට උසස් වීමේ දිනට පූර්වාසන්න වසර හත (07) තුළ සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන ඇති/නැති බව :-

.................................................................................................................................................................

(ආ) සියලුම වැටුප් වර්ධක නියමිත දිනට උපයාගෙන නොමැති නම් ඊට හේතු :-

.................................................................................................................................................................

.................................................................................................................................................................

III. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 06/2006 අනුව අනුමත නව බඳවා ගැනීමේ පරිපාටියට අන්තර්ග්‍රහණය කර ඇති/නැති බව (සහතික කරන ලද පිටපතක් අමුණන්න) :-

.................................................................................................................................................................

IV. රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය සම්පූර්ණ කර ඇති නම් දිනය (සහතික කරන ලද පිටපතක් අමුණන්න) :-

.................................................................................................................................................................

V. පළාත් රාජ්‍ය සේවයේ සිට ස්ථාන මාරු මත හෝ රෝහල් පවරා ගැනීම මත මධ්‍යම රාජ්‍ය සේවයට පැමිණි නිලධරයෙකු නම් මධ්‍යම රජයට අන්තර්ග්‍රහණය කර ඇති/නැති බව (සහතික කරන ලද පිටපතක් අමුණන්න) :- .....................................................................................................................................

VI. (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 යටතේ වැටුප් රහිත විදේශීය නිවාඩු ලබා ගෙන ඇති/නැති බව :-

.................................................................................................................................................................

(ආ) එලෙස වැටුප් රහිත විදේශීය නිවාඩු ලබා ගෙන ඇත්නම් ලබාගත් කාලසීමාව :-

අවුරු :- ......................

මාස :- ......................

දින :- ......................

(ඇ) විදේශ නිවාඩු ලබා ගෙන ඇති කාලසීමාව තුළ ගිවිසුම් ගත පරිදි විදේශ මුදල් සම්ප්‍රේෂණය කර ඇති/නැති බව :- .....................................................................................................................................

(ඇ) විදේශ නිවාඩු ලබා ගෙන ඇති කාලසීමාව තුළ ගිවිසුම් ගත පරිදි වැන්දඹු/ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලෙහි දායක මුදල් ප්‍රේෂණය කර ඇති/නැති බව :-

.................................................................................................................................................................

VII. (අ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022 (II) යටතේ වැටුප් රහිත දේශීය නිවාඩු ලබා ගෙන ඇති/නැති බව :-

.................................................................................................................................................................

(ආ) එලෙස වැටුප් රහිත දේශීය නිවාඩු ලබා ගෙන ඇත්නම් ලබාගත් කාලසීමාව :-

අවුරුදු :- ......................

මාස :- ......................

දින :- ......................

(ඇ) දේශීය නිවාඩු ලබා ගෙන ඇති කාලසීමාව තුළ ගිවිසුම් ගත පරිදි වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලෙහි දායක මුදල් ප්‍රේෂණය කර ඇති/නැති බව :-

..........................................................................................................................................

VIII. (අ) උසස්වීම් දිනට පූර්වාසන්න වසර හත (07) තුළ විනය පරීක්ෂණ හෝ විනය දඬුවම් කිසිවක් ලබා ඇති/නැති බව :- ..........................................................................................................................

(ආ) විනය පරීක්ෂණ හෝ විනය දඬුවම් ලබා තිබේ,

(i) වරද සිදු කල දිනය :- ..........................................................................................

(ii) චෝදනා පත්‍ර නිකුත් කර තිබේ නම් එහි අංකය හා දිනය (සහතික කරන ලද පිටපතක් අමුණන්න) :- ..........................................................................................

(iii) විනය නියෝගයක් ලබා දී තිබේ නම් එහි අංකය හා දිනය (සහතික කරන ලද පිටපතක් අමුණන්න) :- ..........................................................................................

IX. (අ) නිලධාරියාට සේවා කාලය තුළ සේවය හැර යාමේ නිවේදන නිකුත් කර ඇති/නැති බව :-

..........................................................................................................................................

(ආ) එවැනි සේවය හැරයාමේ නිවේදන නිකුත් කර ඇත්නම්, නිලධාරියා නැවත සේවයේ පිහිටුවීමේ ලිපියක් නිකුත් කර ඇති/නැති බව :- ..........................................................................................

(ඇ) ඒ අනුව නැවත රාජකාරී භාරගත් දිනය :- ..........................................................................................

X. (අ) නිලධාරියා ඉල්ලා අස්වීමකින් පසු නැවත සේවයේ පිහිටුවීමක් සිදු කර ඇති/නැති බව :-

..........................................................................................................................................

(ආ) ඒ අනුව නැවත රාජකාරී භාරගත් දිනය :- ..........................................................................................

XI. යාවත්කාලීන කරන ලද චර්යා සටහන (සහතික කරන ලද පිටපතක් අමුණන්න) :- ..................................

XII. (අ) අනුමත කාර්ය සාධන ඇගයීම් පටිපාටිය අනුව උසස්වීම් දිනට පූර්වාසන්න වසර හත (07) තුළ කාර්ය සාධන මට්ටම (ඉතා හොඳයි/හොඳයි/සතුටුදායකයි/අසතුටුදායකයි ලෙස සටහන් කරන්න) :-

1 වසර ..........................................................
2 වසර ..........................................................
3 වසර ..........................................................
4 වසර ..........................................................
5 වසර ..........................................................
6 වසර ..........................................................
7 වසර ..........................................................

(ආ) වෙනත් කරුණු :-

..........................................................................................................................................
..........................................................................................................................................
..........................................................................................................................................

අදාළ නිලධාරියා/නිලධාරිනිය ගේ පෞද්ගලික ලිපි ගොනුව අනුව ඉහත දක්වා ඇති විස්තර හා අයදුම්පතේ අංක 01 හා 02 කොටස් වල සියලු තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

| ................................ | ................................ | ................................ |
|---|---|---|
| දිනය | විෂයභාර නිලධාරියාගේ නම | විෂයභාර නිලධාරියාගේ අත්සන |

03 කොටස :- (ආසන්නතම අධීක්ෂණ නිලධාරියාගේ නිර්දේශය)

ඉහත නිලධාරියා/නිලධාරිනිය මාගේ අධීක්ෂණය යටතේ ................................................................ තනතුරේ සේවය කරන බවත්, ඔහු/ඇය සක්‍රීය හා සතුටුදායක ලෙස තම රාජකාරි ඉටුකරන බැවින් ..................................................... දින සිට අධි ශ්‍රේණියට උසස් කිරීම සුදුසු/නුසුදුසු බවත් නිර්දේශ කරමි.

.....................................

දිනය

......................................................................

ආසන්නතම අධික්ෂණ නිලධරයාගේ අත්සන හා නම සහිත නිල මුද්‍රාව

04 වන කොටස :- (පරිපාලන නිලධාරියා/නිලධාරිනිය ගේ නිර්දේශය)

ඉහත නිලධාරියා /නිලධාරිනිගේ අයදුම්පතේ 01 හා 02 කොටස් වල දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බව සහතික කරමි.

.....................................

දිනය

......................................................................

ආසන්නතම පරිපාලන නිලධරයාගේ අත්සන හා නම සහිත නිල මුද්‍රාව

05 වන කොටස :- (ආයතන ප්‍රධානියාගේ නිර්දේශය)

................................................................................................................................................... තනතුර දරන...................................................................................................................................... මයා/මිය/මෙය සම්බන්ධයෙන් ඉහත දක්වා ඇති සියලු තොරතුරු නිවැරදි බවත්, ඔහු/ඇය මෙම තනතුරේ වසර විසි දෙකක (22) සක්‍රීය හා සතුටුදායක සේවා කාලය ................................................ දිනට සම්පූර්ණ කර ඇති බවත්, ඔහු/ඇය I ශ්‍රේණියේ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය .................................. දින සමත්/අසමත් බව සහතික කරන බවත්,............................................................... දින සිට අධි ශ්‍රේණියට උසස් කිරීම සුදුසු/නුසුදුසු බවත්, නිර්දේශ කරමි/නොකරමි.

................................

දිනය

..........................................................................

ආයතන ප්‍රධානියාගේ අත්සන හා නම සහිත නිලමුද්‍රාව